ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2124/3 - 2019 මැයි මස 21 වැනි අඟහරුවාදා - 2019.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ පනවනු ලබන නියමය**

2005 අංක 06 දරන පනතින් සංශෝධිත 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, 2019 මැයි මස 21 වැනි දිනයෙන් ආරම්භ වන වර්ෂයක කාල පරිච්ඡේදයක් සඳහා මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ විස්තරයෙහි සඳහන් කරනු ලැබ ඇති සේවා සැපයීම මත, එම උපලේඛනයේ II වැනි තීරුවේ ඊට අනුරූපිව සඳහන් කර ඇති නිශ්චිත අනුප්‍රමාණය අනුව එකතු කළ අගය මත බදු ගෙවිය යුතු බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත්කරමි.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මැයි මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| *අනු අංකය* | *I* *විස්තරය* | *II* *බදු අනු ප්‍රමාණය* |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල්, ආගන්තුක නිවාස, ආපන ශාලා හෝ සමාන සේවා සපයන අනෙකුත් ඒ හා සමාන ආයතන විසින් සේවා සැපයුම ; | 5% |
| 2. | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති සංචාරක නියෝජිතයින් විසින් රට තුළට එන සංචාර හා සම්බන්ධ සේවා සැපයුම | 5% |

06 - 31

1A - PG 4525 — 542 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*